සිතන්නට විය. රහස් පරීක්ෂක නිලධාරිෙයක්ගේ බිරිඳ වූ ඈ මීට අදාළ දඬුවම ගැන හොඳාකාරවම දැනගෙන සිටියා ය. ඇයට ඒ ගැන කම්පාවක් දැනුණේ නැති අතර එය එක්තරා ආකාරයක සැනසිල්ලක් සේ සිතෙමින් තිබිණි. එහෙත් දරුවාට කුමක් සිදුවනු ඇතිද? නූපන් දරුවන් කුසේ දරාගත් මිනීමරුවන් වෙනුවෙන් තිබුණේ කවරාකාරෙය් නීති ද? ඔවුන් අම්මාත් දරුවාත් දෙදෙනාම මරා දැමුවා ද? නොඑසේ නම් දඬුවම දීමට දරුවා බිහි වන තුරු බලා සිටියා ද?

මේරි මැලෝනි ඒ ගැන දැන සිටියේ නැත. ඒ නිසා ඒ අවදානම ගැනීමට ඇගේ සූදානමක් තිබුණේ ද නැත.

ඇය මස් ගාතය කුස්සියට ගෙන ගොස්, එය බඳුනක බහා, විදුලි පෝරණුව ක්‍රියාත්මක කර, එය ඊට ඇතුළු කළා ය. ඉනික්බිති දෑත සෝදා ඉහළ මාලයේ නිදන කාමරය වෙත දිව ගියා ය. කැඩපත ඉදිරියේ හිඳ කොණ්ඩය පිළිවෙල කර වත්සුණු තවරා ගත්තා ය. ඇය සිනාවක් පලඳාගන්නට උත්සාහ කළ නමුත් එය අමුතු විරිත්තීමක් සේ දිස් විය. ඈ යළි වරක් උත්සාහ කළා ය.

"හෙලෝ සෑම්'' ඈ උද්යෝගයෙන්, ශබ්ද නගා කැඩපතට කීවා ය.

ඇගේ කටහඬේ තිබුණේ නොගැලපෙන ස්වරයකි.

"කරුණාකරලා මට අල ටිකක් දෙන්න සෑම්, බෝංචි ටින් එකකුත් දෙන්න''

එවර නම් ඇගේ කටහඬත් සිනාවත් සාමාන්‍ය වෙමින් තිබිණි. ඇය තව කීපවරක් ඒ ස්වරය අභ්‍යාස කළා ය. ඉන්පසු පහත මාලයට දිවගොස්, කබාය ඇඟලාගෙන, නිවසේ පසුපස දොරින් පිටවී මහමඟට බැස්සා ය.

වෙලාව සවස හය පසු වී නොතිබුණත් කඩය තුළ විදුලි බුබුළු දැල්වී තිබුණි.

"හෙලෝ සෑම්'' ඇය කවුන්ටරය පසුපස උන් මිනිසා වෙත සිනාවක් පාමින් කීවා ය.

"සුබ සන්ධ්‍යාවක් මිසිස් මැලෝනි, කොහොමද?''

"කරුණාකරලා මට අල ටිකක් දෙන්න සෑම්, ආ.. ඔව්, බෝංචි ටින් එකකුත් දෙන්න'' ඔහු ඈ ඉල්ලූ දෑ දීමට උත්සුක විය.

"පැට්‍රික් ට මහන්සිලු, අද රෑ කෑමට එළියට යන්න බැහැලු'' ඈ ඔහුට කීවාය. "අපි සාමන්‍යයෙන් බ්‍රහස්පතින්දාට රෑ කෑමට එළියට යනවා. අද ඉතින් ගෙදර උයන්න එළවලු මොනවත් නැති බව එයාට අහු වුණා''

"එහෙනම් මස් ටිකකුත් ඕනද මිසිස් මැලෝනි?''

"නෑ, බොහොම ස්තූතියි, මස් තියෙනවා. මම ෆ්‍රීසර් එකෙන් හොඳ බැටළු මස් ගාතයක් ගත්තා''

"ආ!''

"අනේ මන්දා සෑම්, මම නම් ඒතරම් කැමති නැහැ හීතල පිටින්ම මස් උයන්න, ඒත් අද ඒක කරන්න වුණා. ඔයා හිතන්නේ ප්‍රශ්නයක් නැතිවෙයිද?''

"මම නම් හිතන්නේ ඕකේ ලොකු වෙනසක් නැහැ කියලා'' කඩහිමියා කීය "මේ ලොකු අල වලින් දාන්නද?''
"ඔව් ඒවා හොඳයි, එයින් දෙකක් දාන්න''

"වෙන මොනවාද?'' ඔහු හිස ඇල කර ඇය දෙස බලා සිනාසෙමින් ඇසීය. "කෑමට පස්සේ? අතුරුපසට මොනවද දෙන්න හිතාගෙන ඉන්නේ?'

"සෑම් හිතන්නේ මොනවාද හොඳ?'' කඩහිමියා කඩය සිසාරා නෙත් යොමු කළේය. " ලොකු චීස්කේක් කෑල්ලක් දුන්ෙනාත් මොකද? එයා ඒවාට කැමති බව මම දන්නවා''

"නියමයි'' ඈ කීවාය. "එයා චීස්කේක් කන්න හරිම ආසයි''

හැමදේම ඔතා අසුරා දුන් පසු ඈ මුදල් ගෙවා, ඇගේ කාන්තිමත් ම සිනහව ඔහුට දී "බොහොම ස්තූතියි සෑම්, සුබ රාත්‍රියක්'' කීවාය.

"ඔබටත් බොහොම ස්තූතියි මිසිස් මැලෝනි, සුබ රාත්‍රියක්''

දැන්, මේ සිදුවන්නේ රෑ කෑම පිළියෙළ කෙරෙන තුරු බලා සිටින තම සැමියා වෙත තමන් ඉක්මනින් ගෙදර යෑම බව ඇය තමන්ටම කියා ගත්තාය. ඔහු දවස පුරා වෙහෙසවී ගෙදර පැමිණ ඇති නිසා ඇය රෑ කෑම හැකි තරම් රසවත් ව පිළියෙළ කළ යුතු ය. මෙවැනි සිතුවිල්ලකින් නිවසට යන ඇය හට හදිසියේ වත් එහිදී අසාමාන්‍ය, බියකරු දෙයක් දකින්නට ලැබුණොත් ඇය කම්පනයත් ශෝකයත් නිසා උමතුවෙන් මෙන් හැසිරෙන්නට ඉඩ ඇත. එහෙත් ඇය එවැනි කිසි දෙයක් තුන් හිතකින් වත් බලාපොරොත්තු වන්නේ නැත. ඇය මේ කඩයෙන් එළවලු මිළදීගෙන ගෙදරට යනවා පමණි. මිසිස් පැට්‍රික් මැලෝනි බ්‍රහස්පතින්දා හවසක කඩෙන් එළවලු මිළදීගෙන තම සැමියාට රෑ කෑම සූදානම් කරන්නට ගෙදර යනවා පමණි.

එහෙමයි ක්‍රමය, ඇය ඈ ටම කියාගත්තාය. හරි විදිහට, සාමාන්‍ය විදිහට හැම දේම කරන්න. හැමදේම ස්වභාවිකව කරද්දී රඟපාන්නට වුවමනා නොවනු ඇත. ඉතින් මේ විදිහට සිතූ නිසා නිවසේ පසුපස දොරටුවෙන් ඇතුළු වෙද්දී ඈ පුංචි තාලයක් මුමුණමින්, සිනාසෙමින් සිටියා ය.

"පැට්‍රික්!'' ඈ හඬ නඟා කතා කළා ය. " ඔයාට කොහොමද ඩාලිං?''

ඇය අත වූ පාර්සලය මේසය මත තැබූ ඈ විසිත්ත කාමරය වෙත ගියා ය. එසේ ගොස් හදිසියේම ඔහු එහි බිම වැටී සිටි අයුරු දුටු විට, ඔහුගේ දෙපා ඇකිලී, අතක් සිරුරට යටවී ඇඹරී තිබෙනු දුටු විට ඇයට සැබවින්ම කම්පනයක් දැනුණි. ඔහු ගැන ඇගේ සිතේ නිධන්ගතව තිබුණු ආදරය උතුරායන්නට විය. ඇය ඔහු වෙත දිවගොස්, ඔහු අසල දණගසාගෙන වැළපෙන්නට විය. එය කෙතරම් පහසු වීද යත් කිසිම රඟපෑමක් අවශ්‍ය වූයේ නැත.

විනාඩි කිහිපයකට පසු ඇය නැගිට දුරකථනය වෙත ගියා ය. පොලීසියේ දුරකථන අංකය ඇය දැන සිටි අතර අනෙත් පසින් පිළිතුරු ලැබුණු විට ඈ කෑගසන්නට විය.

"ඉක්මනට එන්න! ඉක්මනට! පැට්‍රික් මැරිලා!''
"කවුද කතාකරන්නේ?''

"මිසිස් මැලෝනි, මිසිස් පැට්‍රික් මැලෝනි''

"මොකක්? පැට්‍රික් මැලෝනි මැරිලා?''

"මට එහෙම හිතෙනවා'' ඈ හඬා වැටෙන්නට විය. "එයා බිම වැටිලා ඉන්නේ, මට හිතෙන්නේ එයා මැරිලා කියලා''
"අපි ඉක්මණටම එනවා''

පොලිස් රථය ඉතාමත් ඉක්මණින් පැමිණියේ ය. ඇය දොර විවර කළ විට පොලිස් නිලධාරීන් දෙදෙනෙක් නිවසට ඇතුළු විය. ඈ ඔවුන් දෙදෙනාව හැඳිනුවාය. ඈ ඒ පොලිස් ස්ථානයේ හැම දෙනෙක්ම පාහේ හැඳිනුවා ය. ඇය වැළපෙමින් ජැක් නූනන් නම් පොලිස් නිලධාරියාගේ සිරුරට බර විය. ඔහු සෙමෙන් ඇයව පුටුවක අසුන් ගැන්වුවේය.

"එයා මැරිලාද?'' ඇය හඬමින්ම ඇසුවා ය.

"බොහොම කණගාටුයි, මැරිලා නම් තමයි.

මොකද වුණේ?''

ඇය කඩයට ගිය අයුරු, ආපසු නිවසට ආ පසු ඔහු බිම වැටී සිටිනු දුටු අයුරු කෙටිෙයන් විස්තර කළා ය. ඇය හඬමින් විස්තර කියද්දී නූනන් නම් පොලිස් නිලධාරියා මියගිය මිනිසාගේ හිස පසුපස වියළි ලේ පැල්ලමක් දුටුවේය. ඔහු වහාම දුරකථනය වෙත ගියේ ය.

වැඩි වෙලාවක් ගතවන්නට මත්තෙන් දොස්තර කෙනෙක්, රහස් පරීක්ෂක වරුන් දෙදෙනෙක්, පොලිස් ජායාරූප ශිල්පියෙක්, ඇඟිලි සලකුණු විශේෂඥයෙක් ඇතුළු තවත් නිලධාරීහු කිහිපදෙනෙක්ම පැමිණියහ. මල සිරුර අසල රහස් සාකච්ඡා පැවැත්විණි. රහස් පරීක්ෂක නිලධාරීන් ඇගෙන් නොනවත්වා ප්‍රශ්න රැසක් අසන්නට විය. ඔවුහු ඇයට කරුණාවෙන් කතා කළහ. ඇය යළිත් මුල සිටම ඇගේ කතාව කීවා ය. පැට්‍රික් එද්දී ඈ ඇඳුමක් මසමින් සිටි බව, ඔහුට මහන්සි වැඩි නිසා කෑමට එළියට නොගොස් සිටින්නට තීරණය කළ බව, ඇය මස් පිසීම සඳහා පෝරණුවට දමා එළවලු ගෙන ඒමට කඩයට ගොස් එද්දී ඔහු බිම වැටී සිටි අයුරු විස්තර කළා ය.

"කොයි කඩේ ද?'' එක් නිලධාරියෙක් ඇසීය. ඇය ඊට පිළිතුරු දුන් විට ඔහු ඇගෙන් ඉවතට හැරී තවත් නිලධාරියෙකුට රහසින් යමක් කීවේ ය. දෙවැන්නා වහා වහා නිවසින් පිටතට ගියේ ය.

පැය කාලකින් ඔහු නැවත පැමිණියේ සටහන් පිරුණු කඩදාසියක් අතැතිව ය. වැළපෙමින් සිටි ඇයට ඔවුන්ගේ රහස් සාකච්ඡාවල ඇතැම් වැකි ඇසිණි.

"බොහොම සාමාන්‍ය විදිහට හිටියේ.. සතුටින්.. මහත්තයාට හොඳ කෑමක් දෙන්න ඕනෑකම තිබුණා, බෝංචි, චීස්කේක්.. එයා නම් වෙන්න විදිහක් නැහැ''

ටික වෙලාවකට පසු දොස්තරත්, ජායාරූප ශිල්පියාත් තව මිනිසුන් දෙදෙනෙකුත් සිරුර රැගෙන ගියහ. ඇඟිලි සලකුණු ශිල්පියාත් ගිය පසු ඉතිරි වූයේ රහස් පරීක්ෂක නිලධාරීන් දෙදෙනාත් පොලිස් නිලධාරීන් දෙදෙනාත් පමණි. ඔවුන් ඇයට සැලකුවේ ඉතා විනීතව ය. ඇයට මේ නිවසින් පිටව යන්නට ජැක් නූනන් යෝජනා කළේ ය. ඇගේ සොයුරියගේ නිවසට එසේත් නැත්නම් ඔහුගේම නිවසට වුව යා හැකි බවත් ඔහුගේ බිරිඳ ඇයට නවාතැන් දෙනු ඇති බවත් ඔහු කීය.
එහෙත් ඇය ඒ යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කළා ය. ඇයට අඩියක් වත් සෙලවෙනු බැරි තරමේ අපහසුවක් දැනෙන බව කී ඇය ඔවුන්ගේ රාජකාරි වලට බාධාවක් නොකරන බවට පොරොන්දු වී එතැනම රැඳී සිටින්නට අවසර ඉල්ලුවා ය.

ඇයට අමාරුවක් දැනෙනවා නම් නිදන කාමරයට ගොස් මඳක් වැතිරී සිටීම වඩාත් සුදුසු නොවන්නේදැයි එවර ජැක් නූනන් විමසුවේ ය.

ඇයට ඒ පුටුවටම වී ටික වෙලාවක් සිටින්නට අවශ්‍ය බව ඇය කියා සිටියා ය. ටික වේලාවක් ගත වූ පසු ඇයගේ අමාරු ගතිය පහවූ විට ඇය එතැනින් ඉවත්වන බව කීවා ය.

ඉන්පසු ඔවුහු ඇයට එතැනම ඉන්නට ඉඩ හැර නිවස පරීක්ෂා කිරීමේ නියැලුණහ. ඉඳහිට රහස් පරීක්ෂක වරයෙක් ඇයගෙන් ප්‍රශ්නයක් දෙකක් අසනු පෙනිණි. ඇගේ සැමියා මියගොස් ඇත්තේ හිසේ පසුපසට එල්ල කළ තද පහරක් නිසා බව ජැක් නූනන් ඇයට සෙමෙන් පැහැදිලි කළේය. ඔවුහු ඒ ආයුධය සොයමින් සිටියහ. මිනීමරුවා එය රැගෙන පලායන්නට ඉඩ තිබුණු බවත් නොඑසේ නම් එය ඉවත දමා හෝ සඟවා යන්නට ඇති බවත් ඔහු පැහැදිලි කළේ ය.

"මේක ඉතින් පරණ කතාවම තමයි. ආයුධය හොයාගත්තොත් මිනීමරුවා අල්ලන්න පුළුවන්''

ටික වෙලාවකට පසු එක් රහස් පරීක්ෂක වරයෙක් ඇය අසලින් අසුන් ගෙන නිවසේ ආයුධයක් ලෙස භාවිත කළ හැකිව තිබුණු දෙයක් ගැන ඇයට අදහසක් තිබුණේ දැයි විමසුවේ ය. මුරිච්චි යතුරක්, එසේත් නැත්නම් බර යකඩ මල් පෝච්චියක් වැනි දෙයක් නිවසින් අතුරුදන් වී ඇත්දැයි සොයා බලන මෙන් ඔහු ඉල්ලා සිටියේ ය. ඔවුන්ගේ නිවසේ යකඩ මල් පෝච්චි නොතිබුණු බව ඈ කීවා ය.

"එහෙනම් මුරිච්චි යතුරක්?''

එවැනි ආයුධයක් නොතිබුණු බවට ඇයට විශ්වාස නමුත් එවැනි වෙනත් දේ ගරාජයේ තිබෙන්නට හැකි බව ඈ කීය.

නිවස පරීක්ෂාකිරීම නොකඩවාම සිදු විය. තවත් පොලිස් නිලධාරීන් නිවස වටා

